## ශ්‍රී ලංකාවේ ආදිවාසීන්

# වැදි ජනතාව

ඉතා කුඩා ජන කොටසක් වන වැද්දන් ශ්‍රී ලංකාවේ මුල්ම වැසියන් ලෙස සැලකේ.1911 ජන ලේඛනයට අනුව 5331 ක් වූ වැදි ජනගහණය නැගෙනහිර උතුරු මැද, වයඹ සහ මධ්‍යම පළාත්වල කීප තැනක පැතිර පැවතිණි. විසිවන සියවසේ අවසන ළඟාවන මෙකල බදුල්ල සහ අම්පාර දිස්ත්‍රික්කවල ඔවුහු දෙතුන් සියයකට පමණ සීමා වී සිටිති.

දැනට ලංකාවේ වාසය කරන විශාල ම ජන කොටස වන සියේට 78 පමණ වන සිංහලයන් සහ ඊළඟ විශාල ජන කොටස වන සියේට 12 පමණ වන දෙමළ ජාතිකයින් ඉන්දියා උප මහාද්වීපයෙන් මෙහි සංක්‍රමණය වූ පිරිස් බව ප්‍රසිද්ධ කරුණකි. එහෙත් අන් බොහෝ රටවල මෙන් වඩා දියුණු ශිෂ්ඨාචාරයක් ඇතිව මෙරටට සංක්‍රමණය වූ එම ජන කොටස් ආදී වාසීන් පදිංචිව සිටි පෙදෙස් ආක්‍රමණය නොකළහ. ඔවුන්ගේ සංස්කෘතිය විනාශ නොකළහ. දෙපිරිස අතර ලේ හැලෙන ගැටුම් නොසිදු විය. පිටරටින් අවුත් මෙහි පදිංචි වූ ජන කොටස් සහ දේශවාසීන් අතර පුදුමාකාර සහජීවනයක් පැවැතිණ. විදේශීන් ලංකාව ආක්‍රමණය කළ සමහර අවස්ථාවල එම ආක්‍රමණිකයන් පළවා හැරීමට සහ ඔත්තුකාරයන් ලෙස වැද්දන් ක්‍රියා කළ අයුරු ප්‍රධාන ජන සමූහය වන සිංහලුන්ගේ ඉතිහාස පොත්වල සහ පැරණි සෙල්ලිපි වල සඳහන් ය.

ගම් සහ නගරවල වාසය කරන ජනතාවට වැද්දන් මී පැණි, ඉටි, මුවමස්, ඇත්දත්, බෙහෙත් පැළෑටි වැනි කැළෑවෙන් ලැබෙන ද්‍රව්‍ය සපයා තිබේ. ඇතැම් අවස්ථාවල රාජ්‍ය ගබඩාවට පවා මෙකී ද්‍රව්‍ය සැපයීමට වැද්දනට බාර කැරිණ. ප්‍රධාන ජනසමූහය වන බෞද්ධයන් සහ ඊළඟ ප්‍රධාන සමූහය වන හින්දූනුත් තම ආගම්වලට සරිලන පරිදි රුස්සන ගතියෙන් යුතුව වැද්දන් සමග සාමකාමී සහජීවනයෙන් වෙසෙති. මේ හේතුවෙන් වැද්දන්ගෙන් පැවත එන සිංහල සහ දෙමළ කථා කරන මිනිසුන් ද අපට දකින්නට ලැබේ.

### වැදි සංස්කෘතිය

1940 පමණ දක්වා ගල් ගුහාවල වාසය කරන වැද්දෝ වූහ. විසිවන සියවසේ වැද්දන් පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයනයක් කළ සෙලිග්මාන් හට ගල් ගුහාවක එකට වාසය කළ වැදි පවුල් කීපයක් හමු විය.

එක් පවුලකට ගුහාවේ එක් කොනක් හිමි විය. එම කොටසට අනෙක් වැද්දෝ නොපිවිසියහ. මෙලෙස සැමියා, බිරිය සහ දරුවෝ එකට වාසය කරමින් තම පෞද්ගලිකත්වය සහ ඒකකත්වය රැක ගත්හ. පවුලේ සාමාජිකයන් අතර පවතින දැඩි ඇල්ම සහ චාරිත්‍රධර්ම සියලු විමර්ශකයන් දැක තිබේ. ඉතා ආදරයෙන් සහ සැලකිල්ලෙන් දරුවන් හදා වඩා ගත්හ.


මහාචාර්ය
කේ. එන්. ඕ. ධර්මදාස
පේරාදෙණිය විශ්ව විද්‍යාලය


කෑම පිළියෙල කිරීම සාමූහිකව සිදු කෙරේ. දඩයම සහ ආහාර එකතු කිරීම ද සාමූහිකව සිදුවේ. එහෙත් ලොකු කුඩා කවුරුත් තමනට හිමි කොටස ලබති. සමූහයට අයත් ආයුධ පොදු අව්මඩුවක තබති.

ඇත අවදියේ ඉතිරිවන මස් විශේෂයෙන් සාදන ලද ගස් බෙනයක බහා එහි මී පැණි පුරවා එහි කට මැටි තට්ටුවකින් වසා දැමිණ. මෙය මස් ආරක්ෂා කරන ක්‍රමය විය. මස් ආරක්ෂා කළ තවත් ක්‍රමයක් නම් සිහින් පෙතිවලට කෙදිලා ගල් ලෑලිවල එළා අව්කැවීමයි.

වැදි ගැහැනුන් දරුවන් වැදුවේ ගල් ගුහාවෙහිම ය. අනෙක් ගැහැණු වින්නඹුකාරිය කළහ. පොකෙනි වැල කැපුවේ සියුම් හියකිනි. ඉන් වූ තුවාලය හොඳවීමට අළු තැවැරිණි. සිංහලයන් මෙන් උපත, වැඩිවිය පැමිණීම සහ අර්තවය කිළුටක් (කිල්ලක්) ලෙස නොසැලකූහ.



මසක් පමණ ගෙවුණු විට ළමයාට නමක් තැබිණ. පොදු පිරිමි නම් පොරමොලා, පුල්ලියා කරකොළයා, කිව්වා, බොඩා, පුබ්බරා, කෝනා, කළුවා, කයිරා, හඳුනා, කඳා, ආදි විය. ගැහැණු නම් සුවඳි, වියනි, පිංචි, කළු, සෙල්ලි, කිරී ආදී විය



විවාහ සිදුවුයේ පාරම්පරික සිරිතට අනුවයි. එය දෙමාපියෝ යොදා ගත්හ. ඇවැස්ස නෑනලා මස්සිනාලා අතර විවාහවලට වැඩි සැලකිල්ල දැක්විණ. සිරිතක් වශයෙන් බෑනා වීමට සිටින පුද්ගලයා මී පැණි සහ වියළි මස් තෑගි ලෙස ගෙන මනාලියගේ ගෙදරට පැමිණෙයි. එවිට මාමා නැන්දා මානාලිය මුණ ගස්වති. මනාලිය මනාලයාගේ හිණ වටා දියනූලක් බඳී. මනාලයා තමාගේ හෝ තමාගේ සහෝදරියගේ හිසකෙස්වලින් සැකසූ හවරියක් මනාලියට තෑගි කරයි. මාමා නව යුවළට දුන්නක් සහ ඊතලය තෑගි කරයි.

ගුහා ගෙයක මරණයක් සිදුවූ විට එහි නිවැසියෝ මිනිය කොළවලින් වසා එම ගුහාව අත්හැර ගොස් අලුත් ගුහාවක පදිංචි වෙති. ඉන්පසු "නෑ යකුනට" පාපනාශක පූජාවක් පවත්වති. ඒ සමග ආහාර ද පුදති. මළගිය නෑනෑත්තා කන්දේ යකා හෙවත් කන්දේ වන්නියා ගේ නායකත්වයෙන් යුත් මළගිය යක් රැහැට එක්වනු ඇතැයි ඔහු විශ්වාස කරති.

පාරම්පරික වැදි ජනාවාසවල නෑ යකාට පූජාසනයක් ලෙස නැගුණු කෝටු සිටුවා කොළ සෙවිලි කළ අල්තාරයක් තිබිණ. පැදුරක්, කැත්තක්, ඇටවැලක් විශේෂ භාණ්ඩ ලෙස එහි තැන්පත් කැර තිබිණ. සුදුසු අවස්ථාවන්හි එහි ආගමික වතාවත් පැවැත්විණ. කන්දේ යකා යක් දෙවි සමූහයේ ප්‍රධානියා විය. ඔහුගේ බාල සහෝදර බිළිඳි යකා තවද ප්‍රබල දෙවියෙක් විය. තවත් ප්‍රබල යක් දෙව්වරු වූහ. කළු බණ්ඩාර (මහ කොහොඹ බණ්ඩාර, ඉරුගල් බණ්ඩාර සහ සඳුගල් බණ්ඩාර ඔවුන් අතර වූහ. මේ බණ්ඩාරයන්ගෙන් ඇතැම්හු පැරණි සිංහල පිළිවෙත්වල ද දිස්වෙති. කොහොඹ කංකාරියෙහි ද දක්නට ලැබේ. ඉහළ පෙලේ මුතුන් මිත්තන් දේවත්වයට පත් කිරීම ලංකාවේ පුරුද්දක් ලෙස පෙනීයයි. වැදි සිරිත සිංහලයන් පුරුද්දට ගන්නට ඇතැයි සිතේ. මාවරගල පනික්කා, ලෙපත් යකා, රනගල පනික්කා ආදිහු ද වැදි දෙව්වරුන් ගණයට වැටෙති.

ඇත අවදියෙහි වැද්දනට බොහෝ පුද සිරිත් තිබුණු බව පෙනේ. සෙලිග්මාන් සඳහන් කරන පරිදි.

(1) නෑ යකාට පුද සිරිත් (මරණයකින් පසු)

(2) බඹුරු යකාට - පුදසිරිත්(කැලෑ අල ලබාගැනීමට යකාගෙන් උදව් ලැබීමට)

(3) දොළේ යකාට පුදසිරිත් (මී පැණි එකතු කිරීමේදී ආරක්ෂාව ලැබීමට)

(4) වනගත යකාට පුදසිරිත්(දඩයමේදී රහස් බලවලින් උපකාර ලැබීමට)

(5) රුවල පිළිවෙත(ලෙඩ සුව කැර ගැනීමට)

(6) කොළමඩු නැටීම වසංගත දුරු කිරීමට)

(7) රාහු යකාට පුදසිරිත් -( ලෙඩදුක් නිවාරණයට සහ මී පැණි එකතු කිරීමට වාසනාව උදාකර ගැනීමට)

කිරි මංගල්‍ය වැද්දන්ගේ ප්‍රසිද්ධ ම පිළිවෙතකි. මෙය කරගත් දඩයම ගැන පින්දීමටත් නෑ යකාගෙන් ආශිර්වාද ලබා ගැනීමටත් ඉදිරියේදී කැරෙන දඩයම් සාර්ථක කර ගැනීමටත් කැරිණ. මේ සඳහා කන්දේ යකා සහ බිළිඳි යකාගේ ආශිර්වාදය ද ලබා ගැණිණ. නැට්ටුවන්ගේ පිළිවෙත සාර්ථක වීමට නෑයක් ආවේසය ඉවහල් විය.



වැද්දන් ලංකාවේ ගල් යුගයේ මිනිසාගෙන් පැවත එන්නන් යන්න මානව විද්‍යාඥයන්ගේ සාමාන්‍ය විශ්වාසයයි. මීට සලකුණු බණ්ඩාරවෙල, බලංගොඩ වැනි තැන්වලින් ලැබී තිබේ. එහෙයින් මොවුන් දිවයිනේ ආදිම වැසියන් ලෙස සැලකිය හැකි ය.

සිංහල භාෂාවේ මුල වන ප්‍රකෘතයෙන් සටහන් වී තිබෙන මුල්ම සෙල්ලිපි ලෙස සැලකෙන පැරණිම සිංහල ඓතිහාසික ලේඛණවල මෙම දේශවාසීන් සහ සංක්‍රමණිකයන් අතර සිදු වූ සබඳකම් සඳහන් ය. දෙවන සියවසේ සෙල්ලිපි වල සඳහන් මිලක තිස සහ මිලක පුස යන අය මෙහි ආදීම වැසියන්ගෙන් පැවැතුණු නව ශිෂ්ඨාචාර වැළඳගත් පුද්ගලයන් ලෙස මහාචාර්ය සෙනරත් පරණවිතානයන් හඳුනාගෙන තිබේ. දහහතරවන සියවසේ ලියැවුණු සද්ධර්මාලංකාරයේ ඉපැරණි කතා එකතුවකි. ඉන් එක් කතාවක " නිසද " නැමැති තෙරනමක් ගැන සඳහන් ය. මේ තෙරුන් වැද්දන්ගෙන් පැවත ආ කෙනකු ලෙස සැලකිය හැකි ය.

මෙසේ ආදීම ජන කොටස්වලින් ඇතමුන් නව ශිෂ්ඨාචාරය වැළඳගත් අතර අනෙක් අය ඉන් ඈත්වී තම මුතුන් මිත්තන් මෙන් කලෑ ජීවිතයම ගත කළහ. සිංහල සහ දෙමළ ජනසමූහ ඊට ඉඩ හළහ.

මහාවංශයට අනුව ක්‍රි. පූ. 4 වන සියවසයේ දී පණ්ඩුකාභය රජු එකල තිබී නොයෙක් ආගමික ඇදහිලි සඳහා පූජස්ථාන තැනවිය. ඉන් එකක් ව්‍යාෂ දේව නමින් හැඳින් වේ. මොහු වැදි දෙවියකු විය හැකි ය. දුටු ගැමුණු රජු මහා ස්ථූපය සාදවන විට කැලේ තුඩු ඛණිජ වර්ග වැනි ගොඩනැගිලි ද්‍රව්‍ය වැද්දන් සොයා දුන් බව මහාවංශයේ සඳහන් ය. ඔත්තු සපයන්නන් ලෙස වැද්දන් මහා පරාක්‍රමබාහු රජුට සිය සටන්වලට උදව් දුන් බව පැවැසේ. දෙවන රාජසිංහ රජු ඕලන්දයිනට විරුද්ධව කළ සටන්වලට වැදී හමුදාවක් සහභාගි වී ඇත.

**වැද්දා සහ ස්වාභාවික පරිසරය**

වන වාසීන් ලෙස වන්නියෙලැත්තෝ (වැදි ජනතාව තමන් හඳුන්වා දෙන්නේ වන්නියෙලැත්තෝ යනුවෙනි.) පරිසරයට අඩුම හානින් සිදු කරමින් තම වාසස්ථානයේ ජීවත් වූහ. සතුන් මැරුවේ විනෝදයට නොව ආහාරයටයි. විනෝදයට සතුන් දඩයම් කිරීමේ පුරුද්දක් ඔවුනට නොවී ය. දිවියා, වලහා වැනි භයානක සතුන් නොමැරූහ. වැද්දාගේ ආගම ද මේ ජීවන ක්‍රමයට කෙළින්ම සම්බන්ධ ය. කැලේ ඇවිදින විට දෙවි දේවතාවුන්ගේ ආරක්ෂාව පැතීම මීට සම්බන්ධ ය.

ඔවුන්ගේ දෙවි දේවතාවන් ද පරිසරයේම කොටස් ය. කන්දේ යකා කඳු ආශ්‍රිත නමක් තිබෙන දෙවියෙකි. ඉඳිගොල්ලේ යකා උණපනේ කිරි අම්මා ආදීහු ස්වභාව ධර්මය හා සම්බන්ධ ය.

ඔවුන්ගේ ජීවිතය පරිසරය මත රඳාපැවතුණේත්එය ඔවුන් අතින් සුරැකිණ. ඔවුන්ගේ ප්‍රධාන ආහාරයට අල වර්ග, මී පැණි සහ මස් වර්ග අයත් විය.



දඩයමකට සූදානම් වන දඹානේ හීන් වන්නියා

ඔවුන්ගේ පරම්පරා(වරිග) නම්වල ද ස්වභාවික පරිසරය හා කිට්ටු සම්බන්ධයක් පවතී.

මොරාන වරිගය මොරගස හා සම්බන්ධ වරිගය

නමුදනා වරිගය - නමුදු ගස හා සම්බන්ධ වරිගය

උනාපන වරිගය - ජලය හා සම්බන්ධ වරිගය

තල වරිගය - තල ගම හා සම්බන්ධ වරිගය

අම්බිලි වරිගය - තල ගම හා සම්බන්ධ වරිගය

ඌරු වරිගය - වල් ඌරා හා සම්බන්ධ වරිගය

ආදී වාසීන්ගෙන් ශිෂ්ඨ ජන කොටස් උගත යුතු දෙයක් නම් ස්වභාවික පරිසරයට ගරු කිරීම සහ සංවේදිතාවයි. ගත වූ වසර දෙතුන්දාහ තුළ ශිෂ්ඨාචාරය ගොඩ නැගුනේ ස්වාභාවික පරිසරය විය කරමිනි. එහෙත් වැද්දන් වැනි ආදිවාසීන් ලොවේ බොහෝ කොටස්වල වාසය කරමින් සිටිති. ඔහු ස්වභාවික පරිසරය අවුල් නොකර ශිෂ්ඨ යැයි ජන කොටස්වලට වඩා වැඩි කලක් වාසය කර තිබේ.

# ශ්‍රී ලංකාවේ ආදිවාසීහු ජනාවාස–1953

